ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1981 අංක 40 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූනි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 90 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1981 අංක 40 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූනි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 84/80.

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 40 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** 1980 අංක 24 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— **1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි—

(අ) (xxxi) අනුඡේදයෙහි "පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව ; සහ" යන වචන වෙනුවට "පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (xxxii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xxxiii) 1971 අංක 9 දරන ලංකා කාය වෛද්‍යවරුන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනතින් පිහිටුවන ලද ලංකා කාය වෛද්‍යවරුන්ගේ සංගමය ; සහ

(xxxiv) 1968 අංක 17 දරන ලංකා ඉංජිනේරුවරයන්ගේ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ලංකා ඉංජිනේරුවරයන්ගේ ආයතනය ;" ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) වෙළෙඳ නැව් අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි කරන ලද යොට් යාත්‍රා සහ විනෝද යාත්‍රා සේවයක් පවත්වාගෙනයාම සඳහා වූ යම් ව්‍යවසායයක්—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයින් විසින් හෝ මුළු කොටස් ප්‍රමාණය ම ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයින්ට අයත් සමාගමක් විසින් හෝ නිර්වාසික සමාගම් විසින් හෝ පවත්වාගෙන යන්නේ නම් ; සහ

(ii) අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්නම්,

ඒ ව්‍යවසායයේ ලාභ හා ආදායම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (එ) ඡේදයෙහි " රාජකාරි භාර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට " යන වචන වෙනුවට " රාජකාරි භාර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට හෝ පිටරට වූ ඔහුගේ නිවසට යාමට හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි " මේ පනතේ 15, 16, 16අ, 16ආ, 17, 18, 19, 20, 21, 22අ, 22ආ සහ 22ඇ වගන්ති යටතේ " යන වචන සහ ඉලක්කම් වෙනුවට " මේ පනතේ 15 වන, 16 වන, 16අ, 16ආ, 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22අ, 22ආ, 22ඈ හෝ 22ඇ වගන්ති යටතේ " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ; තවද

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි " (ආ) ඡේදයෙහි සඳහන් " යන වචන වෙනුවට " (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයේ " වර්ග අඩි දෙදහසක් නො ඉක්මවන්නා වූ " යන වචන වෙනුවට " වර්ග අඩි තුන්දහසක් නො ඉක්මවන්නා වූ " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ අතුරු වගන්තියේ " වර්ග අඩි එක් දහසක් හෝ ඊට අඩු අවස්ථාවක, " යන වචන වෙනුවට " වර්ග අඩි එක් දහස් පන්සියයක් හෝ ඊට අඩු අවස්ථාවක, " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ " තීරණාත්මක සාක්ෂි විය යුතුය. " යන වචන වෙනුවට " තීරණාත්මක සාක්ෂි විය යුතු ය ; තවද " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ " හවුල් අයිතිකරුවෙක් ද ඇතුළත් වේ ; තව ද " යන වචන වෙනුවට " හවුල් අයිතිකරුවෙක් ද ඇතුළත් වේ. " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය අත්හැරීමෙන්.

6. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ජ) ඡේදයෙහි—

(අ) එහි (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) යම් ඛනිජ තෙල්, ගෑස් හෝ ඛනිජ තෙල් නිෂ්පාදන, හෝ"; සහ

(ආ) ඒ ඡේදයේ 1 වන පේළියේ "ප්‍රතිත පදනමක් මත" යන වචන සිට 6 වන පේළියේ මැණික් ගල්, ලෝහ හෝ භාණ්ඩ වන—" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ප්‍රතිත පදනමක් මත, ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබ, අවස්ථාවෝචිත පරිදි, මැණික් ගල්, ලෝහ, ඛනිජ තෙල්, ගෑස් හෝ භාණ්ඩ, යම් සකස් කිරීම කට හෝ නිෂ්පාදනය කිරීමකට භාජනය නොකොට නැවත අපනයනය කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, ඒ මැණික් ගල්, ලෝහ, ඛනිජ තෙල්, ගෑස් හෝ භාණ්ඩ වන—"; සහ

(2) එහි (ඩ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ණ) නැවත අපනයන කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද භාණ්ඩ හෝ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පහසුකම් ඇතිකොට පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ව්‍යවසායකින් යම් තැනැත්තකුට උද්ගත වන ලාභ සහ ආදායම.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "1983 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1985 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) ව්‍යවසායක අදාළ දිනට ඉහතින් ම වූ අවුරුදු තුන සඳහා වූ අපනයන ලාභවල සහ ආදායමේ සාමාන්‍යය, අදාළ දිනට ඉක්බිතිව ම එළඹෙන අවුරුදු පහෙන් එක් එක් අවුරුද්ද සඳහා ඒ ව්‍යවසායේ අපනයන ලාභවලින් සහ ආදායමෙන් අඩු කරනු ලැබූ විට ඒ

එක් එක් අවුරුද්දට ලැබෙන අතිරික්තයෙන් සමන්විත, ඒ ව්‍යාපාරයේ, අදාළ දිනට ඉක්බිතිව ම එළඹෙන්නා වූ පස් වසරේ එක් එක් වර්ෂයෙහි, ලාභ සහ ආදායම—

(අ) ඒ ව්‍යවසාය 1972 අප්‍රේල් 1 දිනට පූර්වයෙන් වූ දිනක ඒ ව්‍යවසාය විසින් ඒ ව්‍යවසායේ වෙළෙඳාම සහ ව්‍යාපාරය පවත්වාගෙන යාම ආරම්භ කරන ලද්දේ නම් හා අමාත්‍යවරයා විසින් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 7අ වගන්තිය යටතේ ඒ ව්‍යවසාය 1982 අප්‍රේල් 1 දිනට පෙර අනුමත කරන ලද්දේ නම්; හා

(ආ) ඒ ව්‍යවසායේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම හෝ වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් කොටසක් හෝ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිද්‍රව්‍යයක් වශයෙන් ඒ ව්‍යවසායේ අපනයන පරිවැටුමේ කවර වූ හෝ කොටසක් උද්ගත නොවූයේ නම්

ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය (ඈ) ඡේදය වශයෙන් නැවත අක්ෂර කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) යම් සමාගමක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් 'අදාළ දිනය' යන්න පාවිච්චි කරනු ලබන විට, ඒ සමාගම විසින් හෝ ඒ ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන තැනැත්තා විසින් හෝ, හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් හෝ තෝරා ගන්නා ලද්දා වූ ද කොමසාරිස් ජනරාල්වරයාට ලියවිල්ලකින් දැනුම් දෙන ලද්දා වූ ද 1965 අප්‍රේල් 1 වන දිනයට කලින් දිනයක් නොවූ ද 1974 අප්‍රේල් 1 වන දිනයට පසු දිනයක් නොවූ ද දිනයක් අදහස් වේ.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

*"ඉඩම්වල ඇතැම් පැලෑටි වගා කිරීමේ යෙදෙන ව්‍යවසායවල ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.*

22ඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් සමාගමක, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද යම් ලාභ සහ ආදායම් හැර) ලාභ සහ ආදායම් ඒ සමාගම ස්වකීය ව්‍යාපාරයේ වාණිජ නිෂ්පාදනය ආරම්භ කරනු ලබන දින සිට ගණන් බලනු ලබන දස අවුරුදු කාලයකට ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) (i) තේ, රබර්, පොල් හෝ වී හැර කවර වූ හෝ විස්තරයකට අයත් යම් පැළෑටි ඉඩම්වල වගා කිරීමෙහි ලා ; හෝ

(ii) තේ, රබර්, පොල් හෝ වී හැර කවර වූ හෝ විස්තරයකට අයත් යම් පැළෑටි ඉඩම්වල වගා කිරීමෙහි ලා සහ ඒ වගාවෙන් ලැබෙන ද්‍රව්‍ය සකස් කිරීමෙහි ලා

පමණක් ම නිරත වන්නා වූ; සහ

(ආ) (i) 1981 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාපනය කරන ලද්දා වූ ; සහ

(ii) ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් කෝටි දහයකට නො අඩු වූ ; සහ

(iii) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්දා වූ

නිල ලැයිස්තුගත කරන ලද පොදු සමාගමක් වන

යම් සමාගමකට අදාළ විය යුතු ය.".

**10.** 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) අනුඡේදයේ "16 වන වගන්තියේ (අ) ඡේදයෙහි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "16 වන වගන්තියේ (අ) ඡේදයෙහි හෝ 16අ වගන්තියේ හෝ 16ආ වගන්තියේ " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ (i) (අ) අනුඡේදයේ "16 වන වගන්තියෙහි සඳහන් " යන වචන සහ ඉලක්කම් වෙනුවට "16 වන වගන්තියේ හෝ 16අ වන වගන්තියේ හෝ 16ආ වන වගන්තියේ සඳහන් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ග) ඡේදයේ (ii) වන අනුඡේදයේ "දරන ලද වියදම්" යන වචන වෙනුවට "දරන ලද වියදම් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ජ) ඒ තැනැත්තාගේ සේවකයින් ඔවුන්ගේ සේවා ස්ථානයටත් සේවා ස්ථානයෙනුත් ප්‍රවාහනය කිරීම සඳහා වූ කෝච් රථයක් යෙදවීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (6) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අඩුවූයේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය" යන වචනවල සිට ඒ ඡේදය අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"අඩුවූයේ යම් ප්‍රමාණයකින් ද එම ප්‍රමාණය සඳහන් වේ ; තවද

(iv) ලිඛිත සාක්ෂිවලට අනුව ලැබී ගත යුතුව ඇති බව ඔප්පු කර ඇත්තා වූ ද අය කර ගත නොහැකි බව ඔප්පු වී ඇත්තා වූ ද (වෙළෙඳ ණයක් නොවන) යම් ණයක මුදල එයට ඇතුළත් වේ." ;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(iii) සමාගමක් ඈවර කරනු ලැබ, ආදායම් බද්ද සඳහා ඒ සමාගම තක්සේරු කරනු ලැබීමට යටත් වූ අවසාන තක්සේරු වර්ෂය සඳහා යම් ප්‍රාග්ධන අලාභයක් ඒ සමාගමට ඇත්තා වූ අවස්ථාවක, එම ප්‍රාග්ධන අලාභයෙහි මුදල් ප්‍රමාණය, හැකිතාක් දුරට, ඒ අවසාන තක්සේරු වර්ෂය සඳහා වූ ඒ සමාගමේ සියලු ප්‍රභවයන්ගෙන් වූ ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු ය. තවද, එය එසේ අඩු කළ නොහැකි නම්, ඒ අවසාන තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂ තුනෙන් කිසිවක් සඳහා වූ, ඒ සමාගමේ සියලු ප්‍රභවයන්ගෙන් වූ, ව්‍යවස්ථාපිත ආදායමෙන්, ගෙවීයාමේ අනුපිළිවෙල අනුව, එය අඩු කරනු ලැබිය යුතු ය ; තවද

(iv) (iii) වන අනුඡේදය යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කිරීමක් කරනු ලබන අවස්ථාවක, ඒ සමාගම සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා බද්ද, 123 වන වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද, ඒ අඩු කිරීම සැලකිල්ලට ගෙන ප්‍රතිශෝධනය කළ යුතු ය. තවද ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ඒ සමාගම විසින් ගෙවන ලද බද්දෙහි ප්‍රමාණය සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ප්‍රතිශෝධිත බද්දෙහි ප්‍රමාණය අතර වෙනස දැක්වෙන මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

12. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි (iv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(v) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම ;" ; සහ

(2) ඒ උපවගන්තියේ (ක) ඡේදයෙහි "16අ වගන්තිය හෝ 22ආ වගන්තිය යටතේ අනුමත කරනු ලැබ", යන ඉලක්කම් සහ වචන වෙනුවට "16අ වගන්තිය හෝ 22ආ වගන්තිය හෝ 22ඇ වගන්තිය යටතේ අනුමත කරනු ලැබ" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.".

13. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "උචිත අනුප්‍රමාණ අනුව" යන වචන වෙනුවට "උචිත අනුප්‍රමාණ අනුව : ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසිකයකු ලෙස සලකනු ලබන පුද්ගලයකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද, ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් දොළොස් දහස ඉක්ම වන්නේ යම් මුදලකින් ද ඒ මුදලට වැඩි නොවිය යුතු ය.".

යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. (1) 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1අ) උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදයෙහි "IV වන කොටසෙහි සඳහන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "II වන කොටසෙහි සඳහන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1අ) උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'(1ආ) (අ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, කුඩා සමාගමක් නොවන යම් සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන අවස්ථා වක, බදු අය කළ හැකි ආදායමේ ඒ කොටස මත ගෙවිය යුතු බද්ද මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සියයට විසිපහක අනුප්‍රමාණය අනුව විය යුතු ය.

(ආ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, කුඩා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන්නා වූ ද (මේ උපවගන්තියෙහි "ආදායමේ අදාළ කොටස" යනුවෙන් මින් මතු සඳහන් කරනු ලබන) ඒ ආදායමේ කොටසක් මත ගෙවිය යුතු ආදායම් බද්දේ අනුප්‍රමාණය සියයට විසිපහක් ඉක්මවන්නාවූ ද අවස්ථාවක, එවිට, ආදායමේ අදාළ කොටස සම්බන්ධයෙන්, බද්ද පහත දැක්වෙන පරිදි ආගණනය කරනු ලැබිය යුතු ය :—

(i) ආදායමේ අදාළ කොටස ඒ ප්‍රාග්ධන ලාභයේ මුදල ඉක්මවන්නේ නම්—

(අඅ) ඒ ප්‍රාග්ධන ලාභයේ මුදලට සමාන වන්නාවූ, ආදායමේ අදාළ කොටසේ, ඒ පංගුව මත ගෙවිය යුතු බද්ද, සියයට විසිපහක අනුප්‍රමාණය අනුව විය යුතු ය; තව ද

(ආආ) ආදායමේ අදාළ කොටසේ ශේෂය මත ගෙවිය යුතු බද්ද, මේ පනත යටතේ ඊට අදාළ වන, සියයට විසිපහට ඉහළ, බදු අනුප්‍රමාණයන් අනුව ආගණනය කරනු ලැබිය යුතු ය ;

(ii) ආදායමේ අදාළ කොටස ශුද්ධ ප්‍රාග්ධන ලාභයේ මුදල නොඉක්මවන්නේ නම්, ආදායමේ අදාළ කොටසේ සම්පූර්ණ ප්‍රමාණය මත ගෙවිය යුතු බද්ද, මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සියයට විසිපහක් විය යුතු ය.'.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1අ) උපවගන්තියට කරන ලද සංශෝධනය, 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ත) සහ (ද) ඡේද පිළිවෙලින් (ප) සහ (බ) ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ණ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (ත) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනමට ;

(ද) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 2 දරන එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනතින් පිහිටුවන ලද එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමට ;

(න) 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනතින් පිහිටුවන ලද ටවර්හෝල් රඟහල පදනමට ;".

**16.** 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ "1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ අර්ථානුකූලව අනුමත පුණ්‍යායතනයක් වන පුණ්‍යායතනයකට හෝ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ අර්ථානුකූලව අනුමත පුණ්‍යායතනයක් වන පුණ්‍යායතනයකට හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයෙහි සඳහන් ආයතනයකට, පදනමකට හෝ කොමිෂන් සභාවකට හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය එහි 68අ වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් 68 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය 68අ වශයෙන් නැවත අංක කිරීම.

**18.** "ඉ—නිර්වාසික තැනැත්තන්ගේ බැඳීම්" යන ශීර්ෂයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය වශයෙන් බල සහිත විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නිර්වාසික තැනැත්තන්ගේ ඇතැම් ලාභ අය කරගනු ලැබිය හැකි බව.

68. ශ්‍රී ලංකාවේ තැනැත්තකු, නිර්වාසික තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරමින්, යම් රක්ෂණයක් කරන හෝ යම් රක්ෂණයක් කිරීමෙහි ලා මූලිකව ක්‍රියා කරන හෝ යම් දේපළක් විකුණන හෝ බැහැර කරන හෝ විකිණීමෙහි ලා හෝ බැහැර කිරීමෙහි ලා මූලිකව ක්‍රියා කරන හෝ අවස්ථාවක, ඒ දේපළ ශ්‍රී ලංකාවේ තිබුණ ද ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබීමට තිබුණ ද ඒ රක්ෂණය, විකිණීම හෝ බැහැර කිරීම ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී කරනු ලැබුව ද නැතහොත් ඒ නිර්වාසික තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී කරනු ලැබුව ද ඒවායින් උපලබ්ධ වන මුදල් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ ඒ නිර්වාසික තැනැත්තාට ගෙවනු ලැබුව ද නැතහොත් ඔහු විසින් භාර ගනු ලැබුව ද, එවැනි යම් රක්ෂණයකින්, විකිණීමකින් හෝ බැහැර කිරීමකින් උද්ගත වන ලාභ, ඒ නිර්වාසික තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ දී ඔහු විසින් කරනු ලැබූ ව්‍යාපාරික ගනුදෙනුවෙන් ලබාගත් ලාභ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු වෙනුවෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තා මේ පනතේ සියලු කාර්ය සඳහා ඔහුගේ අනුයෝජිතයා වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, විකුණන ලද හෝ බැහැර කරන ලද දේපළ ඒ නිර්වාසික තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද අවස්ථාවක, විකිණීමෙන් හෝ බැහැර කිරීමෙන් ලබන ලාභ—

(අ) ඒ විකිණීම හෝ බැහැර කිරීම හෝ තොග වශයෙන් කරනු ලැබුවේ නම්, දේපළ

තොග වශයෙන් විකුණන වෙළෙන්දකු විසින් සාධාරණ ලෙස ලැබීමට අපේක්ෂා කරනු ලබන ලාභවලට වැඩි නොවන්නාක් සේ සලකනු ලැබිය යුතු ය ; සහ

(ආ) ඒ විකිණීම හෝ බැහැර කිරීම සිල්ලර වශයෙන් කරනු ලැබුවේ නම්, දේපළ සිල්ලර වශයෙන් විකුණන වෙළෙන්දකු විසින් සාධාරණ ලෙස ලැබීමට අපේක්ෂා කරනු ලබන ලාභවලට වැඩි නොවන්නාක් සේ සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසික ලෙස සලකනු ලබන පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායම, ශ්‍රී ලංකාවේ දී ඉටු කරන ලද සේවාවලින් ලබන ආදායමෙන් පමණක් ම සමන්විත වන්නා වූ ද රුපියල් දොළොස් දහසක් නො ඉක්මවන්නා වූ ද අවස්ථාවක, ඒ ආදායම වෙනුවෙන් බදු අය නොකරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ "ඌ" ශීර්ෂය ආදේශ කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියට ඉහතින් ම දක්වෙන "ඌ" ශීර්ෂය වෙනුවට, පහත දැක්වෙන ශීර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ:—

"(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන්ට ගෙවිය යුතු පොලිය යනාදිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 අ සහ 80 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ "ඌ" ශීර්ෂයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලැබේ:—

"ඇතැම් ණය මත ලැබෙන පොලිය, ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු බව.

80 අ. නිර්වාසික තැනැත්තකුගෙන් ලබා ගන්නා ලද ණයක් මත ඒ නිර්වාසික තැනැත්තාට පොලිය ගෙවනු ලැබිය යුතු අවස්ථාවක සහ ඒ ණය මත ගෙවිය යුතු පොලිය—

(අ) ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තකු විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ; හෝ

(ආ) ඒ ණය මුදල හෝ එහි කොටසක් ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ඇති හෝ ශ්‍රී ලංකාවේ දී පාවිච්චි කරනු ලැබ ඇති හෝ අවස්ථාවක නිර්වාසික තැනැත්තකු විසින් හෝ

දරනු ලබන අවස්ථාවක, ඒ පොලිය ශ්‍රී ලංකාවේ දී උද්ගත වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන හෝ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් රාජ්‍ය භාග, ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු බව.

80 ආ. රාජ්‍ය භාග—

(අ) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් දරනු ලබන ; හෝ

(ආ) 29 වන වගන්තිය යටතේ අඩු කළ හැකි,

ඒ රාජ්‍ය භාග ශ්‍රී ලංකාවේ දී උද්ගත වන හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වන හෝ ලාභ සහ ආදායම ලෙස සලකනු ලැබිය යුතු ය.".

22. 1980 අංක 24 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද, ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය අගට පහත දැක්වෙන අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද, උපලබ්ධ වූ මුදල වූ කලී ප්‍රතියෝජනය කරන ලද ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් වූවක් නම් මේ වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්හි විධිවිධාන අදාළ නොවිය යුතු ය. එවැනි අවස්ථාවක දී, 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට අනුකූල ක්ෂයවීම සඳහා වූ අඩු කිරීම, ඒ ප්‍රාග්ධන වත්කම ප්‍රතියෝජනය කිරීමේ පිරිවැයෙන් රක්ෂණ ඔප්පුවක් යටතේ උපලබ්ධ කරගනු ලබන මුදල අඩු කර ගනු ලැබීමෙන් පසු ඉතිරිවන මුදල මත ආගණනය කරනු ලැබිය යුතු ය.".

23. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2අ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂයට ඉහතින් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් බද්දක්, 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින් පැහැර හරින ලද බද්දට අතිරේකව, දණ්ඩනයක් වශයෙන්, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාර දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් සහ 1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පැහැර හරින ලද මුදලින් සියයට විසි පහකට සමාන වැඩිපුර මුදලක් ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'බද්දට දඩ ආදිය ඇතුළත් විය යුතු බව.

126. මේ පරිච්ඡේදයේ "බද්ද" යන්නට—

(අ) මේ පනත යටතේ අය කරනු ලබන හා නියම කරනු ලබන ආදායම් බද්ද, ධන බද්ද සහ ත්‍යාග බද්ද ;

(ආ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ අය කරනු ලබන්නා වූ සහ නියම කරනු ලබන්නා වූ ද, 1981 අප්‍රේල් මස 1 වන දිනට හෝ ඉන් පසුව පැහැර හරිනු ලැබ තිබුණු හෝ පැහැර හරිනු ලබන්නා වූ ද යම් ආදායම් බද්දක්, ධන බද්දක් සහ ත්‍යාග බද්දක් ;

(ඇ) XV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ගෙවන ලෙස සේවායෝජකයකුට නියම කරන ලද යම් ආදායම් බද්දක්

සහ මේ පනතේ 125 වන වගන්තියේ (2) වන හෝ (2අ) වන උපවගන්ති යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 96ආ වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ, ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් එවැනි යම් බද්දකට එකතු කරන ලද යම් මුදලක් හෝ මුදල්, ඒ ආදායම් බද්දට, ධන බද්දට හෝ ත්‍යාග බද්දට එකතු කරන ලද යම් මුදලක් හෝ මුදල් සහ මේ පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ දරන ලද යම් දඩ, දණ්ඩන මුදල්, ගාස්තු හෝ කවර වූ හෝ වියදම් ද ඇතුළත් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

25. 1980 අංක 24 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ 6 වන විෂයයෙහි "සියයට 35ක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 20ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.